# සමනල පාඩම



**කතාව සහ චිත්‍ර**

විදුනි දිනායා කරුණාරත්න

# පිදුම

හැදූ වැඩූ

අම්මාට

අප්පච්චිට,

අකුරු කියා දුන් ආදරණීය දමයන්ති ගුරු මවුන්ට,

රැකවරණය  දුන් විදුහල්පතිතුමිය ඇතුළු ඇදුරුමඩුල්ලට මේ තුති පුද කරමි......



කෘතියේ නම-සමනල පාඩම

කතෘගේ නම-විදුනි දිනායා කරුණාරත්න

කෘතිය පළ කරන දින-2025.01.26

ISBN අංකය-978-624-208-229-5

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවදිය මෙයයි.දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතිය ගොඩනගා එය රටේ ම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරුඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන

"හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය හා ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛණ කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ආකෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන් ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමාන ය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර

ඔන්න එකමත් එක රටක හිටියා ලස්සනම ලස්සන පුංචි ගැහැනු ළමයෙක්. මේ පුංචි ගැහැනු ළමයාගේ නම තමයි මලිති.



මේ පුංචි ගැහැනු ළමයා හැමදාම ලොකුම ලොකු මල් වට්ටියකට එයාගේ ගෙදර තිබෙන මල් ඔක්කොම කඩනවා.



ඒත් මලිති දැනගෙන හිටියේ නැහැ එයාගේ ගෙදරට ලස්සන ම ලස්සන සමනල යහළුවෝ එනවා කියලා.



ඒ නිසා සමනල යහළුවන්ට මල් පැණි බොන්න මල් පැණි නැහැ.



දවසක් මලිතිට කවුදෝ අඬන සද්දයක් ඇසුණා. මලිති ඒ පැත්තට ගියා.




ආනේ.......පුංචි ම පුංචි සමනල යහළුවෝ ටිකක්.

මලිතිව දැක්ක ගමන් සමනල යහළුවෝ ටික එකපාරට ම ඉගිලිලා ගියා.



දවසින් දවසට මලිතිට සමනල යහළුවෝ අඬන සද්දය තව තවත් වැඩියෙන් ඇසුණා.ඒත් එක ම එක සමනල යහළුවෙක් ඇඬුවේ නෑ.ඒ සමනල යහළුවා මෙහෙම කීවා.

"අපි බය නැතිව ගිහින් ඒ පුංචි ගැහැනු ළමයාට මෙහෙම කියමු."…..



"අනේ පුංචි ගැහැනු ළමයෝ, ඔයා ඔයාගේ ගෙදර තියෙන ඔක්කොම මල් කඩන්න එපා......එතකොට එයා ඒක අහයි.හොඳයි දැන් අපි යමු....."



සමනල යහළුවෝ පුංචි ගැහැනු ළමයාට මෙහෙම කිවුවා.

"අනේ පුංචි ගැහැනු ළමයෝ, අපිටත් මල් ටිකක් ඉතුරු කරලා මල් කඩන්න. ඒ මොකද අපි ගොඩක් ලොකු බඩගින්නක තමයි සිටින්නේ.



මේ කතාව ඇසුණ මලිතිට ගොඩක් දුක හිතුණා. මලිති එදයින් පස්සෙ සමනල යහළුවන්ටත් මල් ටිකක් ඉතුරු කරල තමයි මල් කඩන්නේ.......



නිමි.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමාහා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතු ය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි ය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,සෙනෙවිරත්න මහලේකම්